ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

**කෘෂිකර්ම අමාත්‍යාංශය**

Smallholder Agribusiness Partnerships Programme

## කුඩා පරිමාණ කෘෂිව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන (SAPP)

# තනි පුද්ගල උපදේශකවරයකු තෝරා ගැනීම

කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන (SAPP) කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අතර, ඒ සඳහා ශ්‍රී ලංකා රජය හා කෘෂිකර්ම සංවර්ධනය උදෙසා ජාත්‍යන්තර අරමුදල (IFAD) විසින් හවුලේ අරමුදල් සපයනු ලබයි. මෙම SAPP වැඩසටහන සැලසුම් කොට ඇත්තේ ශ්‍රී ලංකාවේ කුඩා පරිමාණ ව්‍යවසායකයන්ගේ දිළිඳුභාවය අඩු කිරීම හා තරගකාරිත්වය සඳහා දායක වීමටය. වැඩසටහන සංවර්ධනය කිරීමේ අරමුණ වනුයේ වාණිජ්‍ය දිශානති නිෂ්පාදන හා අලෙවි පද්ධතිවලට සම්බන්ධ කුඩා පරිමාණ ගෙහිමියන් 57,000 කගේ දෛනික ආහාරවල තත්ත්වය හා ආදායම තිරසර ලෙස වර්ධනය කිරීම වේ. SAPP වැඩසටහන රාජ්‍ය, පෞද්ගලික හා නිෂ්පාදන සහභාගිත්ව (P සතර) හරහා ග්‍රාමීය සංවර්ධනය මත ජාතික ප්‍රතිපත්ති කාර්ය රාමුවක් යටතේ ශ්‍රී ලංකා රජයේ ප්‍රමුඛතා ළඟා භාරගැනීමට උපකාරී වේ.

පහත සඳහන් තනතුරු සඳහා අපේක්ෂිත අයදුම්කරුවන්, ඉතා ඉහළ උන්නතිකාමී, ප්‍රතිඵල දිශානති හා නායකත්ව හා සාකච්ඡා කුසලතා සනාථ කළ සුවිශේෂී කණ්ඩායම් කළමනාකරණ හැකියාවන් හා විශිෂ්ට අන්තර් පුද්ගල නිපුණතාවලින් යුත් අයවිය යුතුය.

## 1) උපදේශක - ව්‍යාපාර සංවර්ධන - තනතුරු 02

**(පූර්ණකාලීන පදනමින්)**
**සුදුසුකම් හා පළපුරුද්ද**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත්, කෘෂිකර්ම, කෘෂි ආර්ථික විද්‍යා, ව්‍යාපාර කළමනාකරණ සංවර්ධන අධ්‍යයනය, අලෙවි කළමනාකරණය හා ක්ෂේත්‍රයන්හි මාස්ටර්ස් උපාධියක් සමග කෘෂි ව්‍යාපාර හා ව්‍යාපෘති සංවර්ධන ක්ෂේත්‍රයේ අවම වසර 10 ක වෘත්තීය පළපුරුද්ද.

i) කෘෂි කාර්මික හා ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ පළපුරුද්ද.

ii) නිෂ්පාදන සංවිධානවල හා ගොවි සංවිධානවල ව්‍යාපාර යෝජනා සංවර්ධනය, ව්‍යාපාර සංවර්ධනය හා ධාරිතා සංවර්ධනය මත පුහුණු කටයුතු සැලසුම් කොට ඉටුකිරීම සම්බන්ධ පළපුරුද්ද.

iii) විදේශ අරමුදල් යෙදවූ සමාන පැවරුම්වල පළපුරුද්ද අමතර සුදුසුකමක් වේ.

## 2) උපදේශක - ලිංගිකත්වය හා සන්නිවේදනය - තනතුරු 01

**(පූර්ණකාලින පදනමින්)**
**සුදුසුකම් හා පළපුරුද්ද**

i) ලිංගිකත්ව අධ්‍යයනය ග්‍රාමීය සංවර්ධනය ඇතුළත් සමාජවිද්‍යා ක්ෂේත්‍රයේ හෝ ආශ්‍රිත කේෂ්ත්‍රයක මාස්ටර්ස් උපාධියක් සමග කෘෂිකර්ම විද්‍යා ක්ෂේත්‍රයේ විද්‍යා ප්‍රථම උපාධියක් ලබා තිබීම වාසිදායක වනු ඇත.

ii) ලිංගිකත්ව, සන්නිවේදන, පෝෂණය හා සමාජ ඇතුළත් කිරීම් ගැටලු සම්බන්ධව අවම වශයෙන් වසර දෙකක පළපුරුද්ද.

iii) කෘෂිකාර්මික හා ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතීන්වල පළපුරුද්ද අමතර සුදුසුකමක් වේ.

iv) ලිංගිකත්ව සම්බන්ධතා, සන්නිවේදන සංරචක/ ක්‍රියාකාරකම් හා M&E හරහා සලකා බැලීම් සම්බන්ධ ව්‍යාපෘතිවල පළපුරුද්ද.

v) පුහුණු මොඩියුල සැලසුම් කොට ලබාදීම සම්බන්ධ පළපුරුද්ද.

**නිපුණතා හා ප්‍රවීණතාවය**

i) දිළිඳුභාවය ලුහු කිරීම හා ලිංගිකත්ව සමානතාවය සඳහා ඉතා ඉහළ අභිප්‍රේරණයක් හා කැපවීමක් සතුවීම.

ii) ඉංග්‍රීසි භාෂා කථන හා ලිඛිත කාරක හැකියාව.

iii) වෙනත් භාෂා සම්බන්ධ කාරක හැකියාව අමතර සුදුසුකමක් වේ.

iv) දැඩි සමාප්ති සීමාවන් තුළ ඉහළ මට්ටමේ ස්වාධීනව, නම්‍යශීලීව කටයුතු කිරීමේ හැකියාව.

## 3) ප්‍රාදේශීය ව්‍යාපෘති සම්බන්ධීකාරකවරු - තනතුරු 01

**(පූර්ණකාලීන පදනමින්)**
**සුදුසුකම් හා පළපුරුද්ද**

i) කෘෂිකර්ම, කෘෂි ආර්ථික විද්‍යා, කෘෂි ව්‍යාපාර හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක විශේෂ උපාධියක් හෝ උසස් සුදුසුකම්;

ii) ප්‍රජා සංවර්ධනය ඇතුළත්ව කෘෂිකාර්මික නිෂ්පාදන, අලෙවි හෝ ව්‍යාපාර සංවර්ධනය වෙත යොමු කෙරෙමින් විශේෂයෙන් අදාළ වැඩසටහන් සම්බන්ධයෙන් අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද.

iii) කෘෂි ආදායම ඇතුළත්ව, තරගකාරිත්වය වර්ධනය කිරීම මත විශේෂයෙන් යොමු වෙමින් ග්‍රාමීය දිළිඳුභාවය අඩු කිරීම අරමුණු කොට ගෙන ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් සැලසුම් කොට ක්‍රියාත්මක කිරීමේ මෑතක ප්‍රදර්ශනය කළ පළපුරුද්ද.

iv) රාජ්‍ය, දායක, පෞද්ගලික අංශය, රාජ්‍ය නොවන සංවිධාන හා ශාඛා ආයතන ආදී විවිධ පරාසයේ හා මට්ටමේ සංවිධාන සමග සම්බන්ධීකරණ කටයුතුවල ප්‍රදර්ශනය කළ පළපුරුද්ද.

v) වැඩසටහන් ක්‍රියාකාරිත්වයට, නිර්මාණකරණයෙන්, නවෝත්පාදනයට කැමැත්තෙන් යුතුව, විධිමත්ව සිතමින් හා උත්ප්‍රේරක සැලසුම් ප්‍රවේශානුගතව කටයුතු කිරීමේ ප්‍රදර්ශනාත්මක හැකියාව.

vi) දැඩි සමාප්ති නියමයන්ට අනුගාමීව ස්වාධීනව, නම්‍යතාවයෙන් යුතුව මුහුණ දීමේ ඉහළ හැකියාව.

vii) ඉංග්‍රීසි භාෂාව හා දේශීය අනෙකුත් භාෂාවල දැඩි සන්නිවේදන කුසලතා (ලිඛිත, කථන හා ඉදිරිපත් කිරීම)

viii) මයික්‍රෝසොෆ්ට් පැකේජ භාවිතයේ කාරක දැනුම.

**පහත සඳහන් හැකියාවන් හා පළපුරුද්ද සතු අය හට ප්‍රමුඛතාව හිමිවේ.**

අ) කෘෂි ව්‍යාපාර අගයදම සංවර්ධනයට අදාළ ක්‍රියාකාරකම් හා උපායමාර්ගික සැලසුම් සහ ව්‍යාපාර සංවර්ධන හා ප්‍රජා, බලමුළු රැස් කිරීමේ ආශ්‍රිත ධාරිතා ගොඩනැගීම සම්බන්ධව සනාථ කළ පළපුරුද්ද.

ආ) සමාන ධාරිතාවයේ දායකත්ව අරමුදල් සැපයූ ව්‍යාපෘතිවල තාරක පළපුරුද්ද තිබීම අපේක්ෂා කෙරේ.

ඇ) දායකත්ව අරමුදල් සැපයූ වැඩසටහන්වල සහ/ හෝ රාජ්‍ය අංශයේ කෘෂිකර්ම හෝ කෘෂි – ව්‍යාපාර සම්බන්ධ සංවර්ධන කාර්ය පිළිබඳ ශක්තිමත් පසුබිමක් තිබිය යුතුය.

**තාරක ස්ථාන : මධ්‍යම පළාත**

උනන්දුවක් දක්වන අයවලුන්හට, අදාළ යොමු කිරීමේ අනුදේශ (TOR) අපගේ වෙබ් අඩවිය වන **www.sapp.lk** වෙතින් බාගත කළ හැක. **(අදාළ TOR ලේඛන බාගත කිරීම සඳහා "Download" ශීර්ෂය හා "Procurement" උපශීර්ෂය වෙත යොමු වන්න)** කරුණාකර ඔබගේ යෝජනා (TOR ලේඛන ප්‍රකාරව අදාළ විස්තර හා සම්පූර්ණ ජීවදත්ත ඇතුළත්ව) 2022.11.14 දින ප.ව. 2.30ට පෙර තැපැල් මගින් ගෙනැවිත් භාරදීමෙන් පහත සඳහන් ලිපිනය වෙත ලැබීමට සැලැස්විය යුතු අතර, නැතහොත්, ඊමේල් procurement@sapp.lk මගින් එම අයදුම්පත් යොමු කළ හැක. ඊමේල් ලිපිනයේ විෂය ශීර්ෂයෙහි අයදුම්කරනු ලබන තනතුරු නාමය සඳහන් කළ යුතුය. **සභාපති, උපදේශක ප්‍රසම්පාදන කමිටුව, ව්‍යාපෘති (CPCP), කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන, අංක 214/ඒ, නාවල පාර, රාජගිරිය.**

වැඩිදුර විස්තර සඳහා, දුරකථන අංක 011-2448031 හෝ gamini@sapp.lk මගින් රාජකාරී දිනවල, පෙ.ව. 9.00 හා ප.ව. 3.00 අතර කාලය තුළ ප්‍රසම්පාදන විශේෂඥ අමතන්න.

**වැඩසටහන් අධ්‍යක්ෂ,**
**කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන (SAPP),**
**අංක 212/ඒ, නාවලපාර,**
**රාජගිරිය.**